# රුහුණ විශ්වවිද්‍යාලය

## 2023/2024 වර්ෂය සඳහා ආපනශාලා පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන කැඳවීම

රුහුණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ කාර්යය මණ්ඩලයට 2023/2024 වර්ෂය සඳහා ආහාරපාන සැපයීම සඳහා ආපනශාලා පවත්වාගෙන යාමට පිළිගත් ආයතන වලින් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් 2023.06.06 දින ප.ව. 2.00 දක්වා ප්‍රසම්පාදන අයදුම්පත්‍ර භාරගනු ලැබේ. සේවා අවශ්‍ය කරන ආපනශාලා පහත දක්වා ඇත.

1. ශිෂ්‍ය ආපනශාලා
   - I. වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ පිහිටි ශිෂ්‍ය ආපනශාලා
     - i. ඉහළ ශිෂ්‍ය ආපනශාලාව, වැල්ලමඩම, මාතර
     - ii. විද්‍යා පීඨ ආපනශාලාව, වැල්ලමඩම, මාතර
     - iii. කළමනාකරණ හා මුල්‍ය පීඨ ආපනශාලාව, වැල්ලමඩම, මාතර
     - iv. ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨ ආපනශාලාව, වැල්ලමඩම, මාතර
   - II. වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ සහ අවට පිහිටි විශ්වවිද්‍යාලයට අයත් නේවාසිකාගාර ආපනශාලා
     - i. වැල්ලමඩම අංක 02 කාන්තා නේවාසිකාගාර ආපනශාලාව,වැල්ලමඩම, මාතර
     - ii. වැල්ලමඩම අංක 03 කාන්තා නේවාසිකාගාර ආපනශාලාව,වැල්ලමඩම, මාතර
     - iii. මැද්දවත්ත පිරිමි නේවාසිකාගාර ආපනශාලාව, මැද්දවත්ත, මාතර
     - iv. එළියකන්ද පිරිමි නේවාසිකාගාර ආපනශාලාව, එළියකන්ද, මාතර
     - v. එළියකන්ද කාන්තා නේවාසිකාගාර ආපනශාලාව, එළියකන්ද, මාතර
   - III. කරාපිටිය වෛද්‍ය පීඨ පරිශ්‍රයේ සහ සම සෞඛ්‍ය පාඨමාලා පරිශ්‍රයේ පිහිටි ශිෂ්‍ය ආපනශාලා
     - i. ශිෂ්‍ය ආපනශාලාව, වෛද්‍ය පීඨය, කරාපිටිය,ගාල්ල
     - ii. ශිෂ්‍ය ආපනශාලාව අංක I, සම සෞඛ්‍ය වෛද්‍ය පාඨමාලා ඒකකය, මහමෝදර,ගාල්ල
     - iii. ශිෂ්‍ය ආපනශාලාව අංක II, සම සෞඛ්‍ය වෛද්‍ය පාඨමාලා ඒකකය, උළුවිටිකේ,ගාල්ල
   - IV. මාපලාන කෘෂිකර්ම පීඨ පරිශ්‍රයේ පිහිටි ආපනශාලා
     - i. ශිෂ්‍ය ආපනශාලාව, කෘෂිකර්ම පීඨය, මාපලාන,කඹුරුපිටිය
   - V. හපුගල ඉංජිනේරු පීඨ පරිශ්‍රයේ පිහිටි ශිෂ්‍ය ආපනශාලා
     - i. ශිෂ්‍ය ආපනශාලාව අංක I, ඉංජිනේරු පීඨය, හපුගල,ගාල්ල
     - ii. ශිෂ්‍ය ආපනශාලාව අංක II, ඉංජිනේරු පීඨය, හපුගල,ගාල්ල
     - iii. නාවික ඉංජිනේරු හා නෞකා නිර්මාණ ශිල්ප අධ්‍යයනාංශය, මාගාල්ල, ඉංජිනේරු පීඨය
   - VI. තාක්ෂණ පීඨ පරිශ්‍රයේ පිහිටි ආපනශාලා
     - i. ශිෂ්‍ය ආපනශාලාව, තාක්ෂණ පීඨය, කරගොඩ උයන්ගොඩ,කඹුරුපිටිය
2. කාර්ය මණ්ඩල ආපනශාලා
   - i. සේවක ආපනශාලාව , කෘෂි පීඨය, මාපලාන,කඹුරුපිටිය

ප්‍රසම්පාදන ආකෘති පත්‍ර සහ විස්තර ලබා ගැනීම සඳහා ආපසු ගෙවනු නොලබන රු. 1000/-ක ගාස්තුවක් මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපත ශිෂ්‍ය කටයුතු අංශයේ සහකාර ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය. කාර්යාල දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 අතර වේලාවන් තුළදී ශිෂ්‍ය කටයුතු අංශයට පැමිණීමෙන් 2023.05.12 සිට 2023.05.31 දින දක්වා ප්‍රසම්පාදන අයදුම්පත් ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලය තුළ ආපනශාලා පවත්වාගෙන යාමට නුසුදුසු බවට විශ්වවිද්‍යාලය විසින් තීරණය කර ඇති කිසිදු ආයතනයකට හෝ පුද්ගලයකුට ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කරනු නොලබනු ඇත.

සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන අයදුම්පත් මුද්‍රා තබා නියමිත දිනට පෙර සභාපති/විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව, රුහුණ විශ්වවිද්‍යාලය,මාතර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ගෙනවිත් භාර දෙන්නේ නම් ලේඛකාධිකාරි කාර්යාලයේ ඇති අංක 01 දරණ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. අදාළ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ආපනශාලාවේ නම පැහැදිලිව සඳහන් කල යුතුය.

2023.06.06 දින ප.ව. 2.30ට ප්‍රසම්පාදන විවෘත කරන අතර ඔබට හෝ ඔබගේ නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

සභාපති / විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව
රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
2023.05.10